# කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

# (UCIARS)

## වැලිගත්ත, හම්බන්තොට

# අධ්‍යක්ෂ තනතුර

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (University of Colombo Institute for Agro-Technology and Rural Sciences–UCIARS) අධ්‍යක්ෂ තනතුර සඳහා **2026 ජූලි 28** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරු පත්වීමේ දිනයේ සිට වසර තුනක කාලයක් හෝ ඔහු/ඇය ඔහුගේ/ඇයගේ වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ යන දෙකෙන් පළමුවෙන්ම එළඹෙන අවස්ථාව තෙක් රාජකාරී කාලය  බලාත්මක වනු ඇත.

UCIARS යනු කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව 2008 වර්ෂයේ සැප්තැම්බර් මස වැලිගත්ත, හම්බන්තොට ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද ආයතනයකි. මෙම ආයතනය පාඨමාලා (කෘෂි තාක්‍ෂණය පිළිබඳ උපාධිය) පවත්වන අතර කෘෂි තාක්‍ෂණය, කෘෂි ව්‍යාපාර, ග්‍රාමීය විද්‍යාව සහ ඒ ආශ්‍රිත අනෙකුත් අංශයන්හි උපදෙස්, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන, උපදේශන සහ ප්‍රජා සේවා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා සහ ගණන් දීමේ නිලධරයා වන්නේය. ඔහු නිලබලයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ, ශාස්ත්‍රීය මණ්ඩලයේ සහ අධ්‍යයන මණ්ඩල වල සාමාජිකයෙකු මෙන්ම සභාපතිවරයා ද වන්නේය. ඔහු සනාථන සභාවේ ද සාමාජිකයෙකු වේ. ආයතනය තුළ විනය පවත්වා ගැනීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ මඟ පෙන්වීම යටතේ අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

අධ්‍යක්ෂවරයා ඔහුගේ/ඇයගේ බුද්ධිමය මෙන්ම කළමනාකරණ පළපුරුද්ද තුළින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දැක්මක් ඇති පුද්ගලයෙකු විය යුතුය. අයදුම්කරු විශිෂ්ට පර්යේෂණ ප්‍රකාශන පැතිකඩක් සහිත, ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල කුසලතා සහිත නායකත්ව ගුණාංග ඔප්පු කර ඇති සහ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇති, උසස් අධ්‍යයන දක්‍ෂතාවයකින් සහ අවංකභාවයකින් යුත් පුද්ගලයෙකු වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

තෝරා ගන්නා අයදුම්කරු හම්බන්තොට, වැලිගත්ත UCIARS ආයතනයේ අධ්‍යක්ෂ ලෙස පූර්ණකාලීනව සේවය කළ යුතුය.

අධ්‍යක්ෂවරයාට මහාචාර්යවරයෙකුගේ වැටුපක් සහ තනතුරට අදාළ වෙනත් දීමනා ලැබෙනු ඇත.

**අධ්‍යක්ෂ තනතුර සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන් පහත ඇමුණුම් සමඟ ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**

(i) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතක් [UCIARS වෙබ් අඩවියෙන් (www.uciars.cmb.ac.lk) බාගත හැකිය].

(ii) උපන්දිනය ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත සටහනක් (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අමුණා තිබීම අනිවාර්ය වේ).

(iii) ආයතනයේ සංවර්ධනය පිළිබඳ දැක්ම සහිත ප්‍රකාශයක්

(iv) අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත අරමුණු සඳහා යෝජනා ඇතුලත් කෙටි විස්තරයක්

(v) අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතික වල සහතික කරන ලද පිටපත් සහ නායකත්වය, පර්යේෂණ විශිෂ්ඨත්වය, ඇගයීම් සහ පරිපාලනය ආදිය සඳහා අදාල සාක්ෂ්‍යවල සහතික කරන ලද පිටපත්.

(vi) වත්මන් අධ්‍යක්ෂවරයා අයදුම්කරුවෙකු නම් හෝ ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දැරූ අයෙකු නම්, ඔහු/ඇය ඔහුගේ/ඇයගේ පළමු ධුර කාලය තුළ ජයග්‍රහණ ඉස්මතු කරමින් වාර්තාවක් ලබා දිය යුතුය. එම වාර්තාවේ මෘදු පිටපතක් PDF ආකෘතියෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී විසින් දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

(vii) රාජ්‍ය අංශයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු නම්, අයදුම්කරු ආයතනයෙන් නිදහස් කළ හැකි බව තහවුරු කරමින් ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ 2024.01.01 දිනැති UGC චක්‍රලේඛ අංක 01/2024 හි දක්වා ඇති උපදෙස් අනුව ය (චක්‍රලේඛය www.ugc.ac.lk වෙතින් බාගත කළ හැකිය).

නිසි පරිදී සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉල්ලා සිටින ඇමුණුම් සමඟ මුද්‍රා තැබූ කවරයක/ලියුම් කවරයක බහා **නියෝජ්‍ය ලේඛකාධිකාරී, කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට** යන ලිපිනය වෙත **2026 ජූලි 28** හෝ ඊට පෙර ඉහත කාර්යාලයට පැමිණ භාර දී හෝ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ඊට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක්, PDF ආකෘතියෙන් ඇති වෙනත් ඕනෑම ආධාරක ලේඛනයක් සමඟ, **dr@uciars.cmb.ac.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/විද්‍යුත් තැපෑලෙහි විෂය රේඛාවේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ සහ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

කළමනාකරණ මණ්ඩලයේ ලේකම්
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත, හම්බන්තොට
Tel : 047-2034253/211
**2026.06.28**